# විෂයය

බුද්ධ ධර්මය

## නිපුණතාව

බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ක්‍රියා කරයි.

## නිපුණතා මට්ටම

සප්ත අපරිහානි ධර්ම අධ්‍යයනය කර සාමූහක වගකීමෙන් යුතුව ක්‍රියා කරයි.

## පාඩම

21

පිරිහීම මග හරින අපරිහානීය ධර්ම

සැකසුම - පූජ්‍ය තාරපේරියේ ගුණරතන හිමි

**8 ශ්‍රේණිය**

**බුද්ධ ධර්මය**

**21 පාඩම**

**පිරිහීම මග හරින අපරිහානීය ධර්ම**

01. සප්ත අපරිහානි ධර්ම ක්‍රියාත්මක වූයේ.......
    1. මගධ රාජ්‍යයේ ය. 2. කෝසල රාජ්‍යයේ ය.
    3. වත්ස රාජ්‍යයේ ය. 4. වජ්ජි රාජ්‍යයේය .
02. වස්සකාර යනු ........
    1. බිම්බිසාර රජුගේ අමාත්‍යවරයෙකි.
    2. අජාසත්ත රජුගේ අමාත්‍යවරයෙකි.
    3. කොසොල් රජුගේ අමාත්‍යවරයෙකි.
    4. සුද්ධෝදන රජතුමාගේ අමාත්‍යවරයෙකි
03. ජගත් කාන්තා දිනය සමරනු ලබන්නේ.....
    1. මාර්තු 8 වැනි දා ය
    2. මාර්තු 13 වැනිදා ය.
    3. ජූලි 05 වැනි දා ය.
    4. ජුනි 4 වැනිදා ය.
04. වැඩිහිටියන්ගේ උපදෙස් පිළිපැදීම දියුණුවට හේතුවන බව
    1. සාලිකේදර ජාතකය උගන්වයි.
    2. අත්ථස්සද්වාර ජාතකය උගන්වයි.
    3. චුල්ල සෙට්ටි ජාතක උගන්වයි.
    4. උම්මංග ජාතකයේ උගන්වයි.
05. වaද්ධාපචායනය යනු......
    1. වැඩිහිටියන්ට සැලකීමයි.
    2. ගුරුන්ට සැලකීමයි.
    3. භාවනා කිරීමයි.
    4. මගේ ව කටයුතු කිරීමයි.

06. උපසපන් භික්ෂූන් වහන්සේලා.....
 1. මසකට වරක් රැස් වේ.
 2. මසකට දෙවරක් රැස්වේ.
 3. වසරකට එක් වරක් රැස් වේ.
 4. වසරකට දෙවරක් රැස්වේ.

07. අතීත භාරතයේ කාන්තාව වද බන්ධනයන්ට පීඩාවන්ට පත් කළේ.
 1. බ්‍රාහ්මණ ඉගැන්වීම් තුළ ය
 2. ජෛන දහම තුළ ය
 3. බෞද්ධ ඉගැන්වීම් තුළ ය
 4. ආජීවක ඉගැන්වීම් තුළ ය

08. වජ්ජි ලිච්ඡවී රජ දරුවන් තම සමූහාණ්ඩු තුළ අනුගමනය කළ කරුණු ගණන..
 1. 7 කි
 2. 8 කි
 3. 9 කි
 4. 10 කි

09. වජ්ජීන් සමඟ සටනට සූදානම් වූ ආඥාදායක රජතුමා .....
 1. කෝසල රාජ්‍යයේ රජුය.
 2. මගධ රාජ්‍යයේ රජුය.
 3. වත්ස රාජ්‍යය රජුය.
 4. අවන්ති රාජ්‍ය රජය.

10. බුදුරජාණන් වහන්සේ සාසනයේ ආයුෂ ලෙස දැක්වූයේ.....
 1. ධර්මයයි.
 2. විනයයි.
 3. ධර්මය හා විනය යි.
 4. අපිට යයි.

## ii.කොටස

01. i. බුදුරජාණන් වහන්සේ සප්ත අපරිහානි ධර්ම දේශනා කළේ කාටද?
    ii. එම කරුණු අතුරින් තුනක් ලියන්න.
    iii. ඉන් එකක් පිළිබඳව කෙටියෙන් දක්වන්න.

02. i. සප්ත අපරිහානි ධර්ම දේශනා කළේ කොහේදී ද?
    ii. සප්ත අපරිහානීය ධර්ම අනුගමනය කළේ කුමන පාලකයින් ද?
    iii. සමගිව රැස් වීම, සමගිව කටයුතු කිරීම, සමගිව විසිර යාම, ඔබේ පාසලේ වැඩ කටයුතුවලට වැදගත් වන අයුරු පිළිබඳව වාක්‍ය පහක් ලියන්න.

03. i. බුදුරජාණන් වහන්සේ ලිච්ඡවීන්ට දේශනා කරන ලද පිරිහීමට හේතුවන කරුණු කීයද ?
    ii. නිතර රැස්වීමෙන් රටකට ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න.
    iii. නොපැනවූ නීති නොපැනවීම හා පැන වූ නීති ආරක්ෂා කිරීම පාසලේ විනය ට ඉතා වැදගත් වේ. මේ පිළිබඳ වාක්‍ය තුනක් ලියන්න.

## පිළිතුරු

### i කොටස

| | |
|---|---|
| 01. 4 | 06. 2 |
| 02. 2 | 07. 1 |
| 03. 1 | 08. 1 |
| 04. 2 | 09. 2 |
| 05. 1 | 10. 2 |

## ii. කොටස

01. i. ලිච්ඡවි රජදරුවන්ට

ii. 1. නිතර රැස්වීම
2. සමගිව රැස්ව සමගිව සාකච්ඡාවට සමගිව විසිර යාම
3. නොපැනවූ නීති නොපමුණුවමින් පැනවූ නීති කඩ නොකර ආරක්ෂා කිරීම
4. වැඩිහිටියන්ගේ උපදෙස් පිළිපදිමින් ඔවුන්ට ගරු කිරීම
5. විවාහක කුල කාන්තාවන්ගේ හා අවිවාහක කුල කුමරියන් ගේ ආරක්ෂාව තහවුරු කිරීම
6. වජ්ජි රාජ්‍ය තුළ දී හා පිටතදී පූජනීය ස්ථාන වලට ගරු කරමින් ඒවා නඩත්තු කිරීම
7. තම රාජ්‍යයට නොපැමිණි පූජ්‍ය පක්ෂය ගෙන්වාගැනීමටත් පැමිණ සිටින පූජ්‍ය පක්ෂයට දැහැමි රැකවරණය සලසා දීමත් සිදු කිරීම

iii. 8 ශ්‍රේණිය බුද්ධ ධර්මය පොතේ 21 වන පාඩමෙ 141 සිට 145 පිටු බලන්න.

02. i. සාරන්දද චෛතිය
ii. වජ්ජි රාජ්‍යයයි.
iii. 1. වැඩසටහනකදී නම් ඉතා තාර්කිකව අවසන් කළ හැකිය.
2. ගුරුවරුන්ගේ ඉගනුම් ඉගැන්වීම් කාර්ය කාර්යය සාර්ථක කරගත හැක
3. දරුවන්ගේ ද අධ්‍යාපන කටයුතු විෂය විදේශ නියමිත කාලයට අවසන් කළ හැක.
4. මහා සෑය කීර්තිනාමය ප්‍රදේශය පුරා පැතිරී යනු ඇත.
5. විශේෂ තරග අවස්ථාවලදී ජයග්‍රහණය ලබා ගැනීමේදී වැදගත් වේ.

03\. i. 7 කි.

ii. 1. කලින් කලට පැනනගින ගැටලු සාමකාමී සහ සාධාරණ ලෙස නිරාකරණය කර ගැනීමට හැකි වීම.

2\. පාලකයන් අතර සුහදශීලීතාව හා මිත්‍රශීලී භාවය වර්ධනය වේ.

3\. ක්ෂණිකව පැන නගින ගැටලුවලට විසඳුම් ලබාගත හැකිවීම.

iii. 1. පාසල් විනය පද්ධති ආරක්ෂා වීම සිදුවේ.

2\. ඒ තුළින් පාසලේ වැඩ දැක්ම මෙහෙවර ඉටු කර ගැනීමට හැකි වෙයි.

3\. පාසලේ ගැටුම් අවම වීම තුළින් ඉගෙනුම් ඉගැන්වීම් කටයුතුවලට බාධා නොවෙයි.

4\. විනයගරුක වීම තුළින් පාසල බැබළීමට පත් වේ.